**වගා ආධාර චක්‍රලේඛ අංක 18:**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474,
කොළඹ. 03.
1989.03.10

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

මාතෘකාව: **මිශ්‍ර වගා යටතේ තේ වගා කිරීම**

## 1.0 චක්‍රලේඛයේ පරමාර්ථය:

1.1 මහනුවර, කෑගල්ල, මාතර හා රත්නපුරය යන දිස්ත්‍රික්කවල පිහිටි තෝරා ගත් තේ ඉඩම්වල නියමු ව්‍යාපෘතියක් වශයෙන් කරාබු, කෝපි හා ගම්මිරිස් වගා කිරීමට දැනටමත් ඉඩකඩ සලසා ඇත. තවද ඕනෑම ප්‍රදේශයක තේ වගා කරනු ලබන ඉඩමක කොස් ගස් හා පොල් ගස් ඇතිවිට නියමිත බිම් ප්‍රමාණයක් අඩු කිරීමට දැනට උපදෙස් දී ඇත.

ඉහත සඳහන් ශාක හැරුණු විට වෙනත් ශාක වර්ග තේ වගා කරන ඉඩමේ ඇති විට එයට අඩු කළ යුතු බිම් ප්‍රමාණය නිශ්චිත ලෙස දක්වා නොමැති බැවින් ද, විවිධ ප්‍රාදේශීය කාර්යාලවල විවිධ පිළිවෙත් මේ පිළිබඳව අනුගමනය කර ඇති බැවින් ද, මිශ්‍ර බෝග යටතේ තේ වගා කිරීමේදී ඉදිරියේදී අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය පිළිබඳව උපදෙස් දීම මෙහි පරමාර්ථයයි.

## 2.0 ක්‍රියා පිළිවෙත:

තේ නැවත වගාව සහ අලුතෙන් වගා කිරීම යන ආධාර ක්‍රම යටතේ තේ වගා කිරීමට අවසරදීමේදී මිශ්‍ර වගා සහිත ඉඩම් සම්බන්ධයෙන් මෙහි පහත දැක්වෙන ක්‍රියා මාර්ගය අනුගමනය කරන්න. ඒ අනුව පහත දැක්වෙන වගා තත්ත්වයන් ඇති ඉඩම් ද පසු සැපයීමේ ආධාර ක්‍රමයට සහභාගිවීමට සුදුසු වේ.

### 2.1 බිම් ප්‍රමාණයක් අඩු නොකර වෙනත් වගා සඳහා ඉඩදීම

(අ) කරාබු, කෝපි හා ගම්මිරිස් පහත දැක්වෙන පරතරයන්ට අනුව වගා කර ඇත්නම් කිසිම බිම් ප්‍රමාණයක් අඩු නොකර තේ වගාවට අවසර දෙන්න.

| වගාව | පරතරය | අක්කරයකට තිබිය හැකි උපරිම ගණන |
|---|---|---|
| කරාබු | අඩි 40Xඅඩි40 | 30 |
| කෝපි | අඩි 20Xඅඩි20 | 110 |
| ගම්මිරිස් | අඩි 20Xඅඩි20 | 110 |

තේ වගාවේ සෙවණ සඳහා අනුමත ගස් වර්ග පමණක් ගම්මිරිස් වැල් යැවීම සඳහා යොදා ගෙන තිබිය යුතුය.

ගම්මිරිස් සඳහා බිම්ප්‍රමාණයක් අඩු නොකළ යුත්තේ ඉහත දැක්වෙන පරතරය මත ගම්මිරිස් සිටුවා තේ වගාවට අනුමත සෙවන ගසකට වැල් යවා ඇත්නම් පමණි. වෙනත් ගසකට වැල් යවා ඇත්නම් එම ගසට අඩු කළ යුතු බිම් ප්‍රමාණය මෙහි 2:2 ඡේදය පරිදි නිර්ණය කරන්න. එවිට ගම්මිරිස් වැල් සඳහා බිම් ප්‍රමාණයක් අඩුකිරීමේ අවශ්‍යතාවය පැන නොනඟී.

ඉහත සඳහන් පරතරය ඉක්මවා මෙකී බෝග වගා කර ඇත්නම් මෙහි 2:2 ඡේදය යටතේ නියමිත බිම් ප්‍රමාණය අඩු කොට අවසර දීමට පුළුවන.

(අ) මිශ්‍ර වගා වක් නොමැති ඉඩමක තේ නැවත/අලුතින් වගා කිරීම සඳහා අවසරපත්‍ර ලබා ඇති විට ඉහත බෝග 03 අතුරින් එක් බෝගයක් පමණක් එහි දක්වා ඇති පරතරයට අනුව වගා කිරීම සඳහා බිම් ප්‍රමාණයක් අඩු නොකර අවසර දිය හැකිය.

2. <u>වෙනත් ශාක සඳහා බිම් ප්‍රමාණයක් අඩු කර අවසර දීම.</u>

(අ) ඉහත 2:1 හි සඳහන් බෝගවලට අමතරව වෙනත් ශාක වර්ග තේ වගා කරනු ලබන ඉඩමේ නො උදුරා තබා ගැනීමට අවශ්‍ය අවස්ථා වලදී මෙහි අංක 1 උපලේඛනයේ දැක්වෙන පරිදි වගා බිම් ප්‍රමාණයෙන් නියමිත බිම් ප්‍රමාණයක් අඩු කර අවසර දෙන්න.

ඒ අනුව යම් ශාකයක් සඳහා බිම් ප්‍රමාණයක් අඩු කරන විට එකී ශාකයට යාවූ පැෂන් පෘට් ,ගම්මිරිස් වැනි වැල් තිබේනම් එම වැල් සඳහා අමතර අඩු කිරීමක් සිදු නොකළ යුතුය.

(ආ) ඉහත 'අ' යටතේ සඳහන් නොවන යම් ශාක වර්ගයක් එහි තුමන කාණ්ඩයකට ඇතුළත් කළ යුතුද යන්න පිළිබඳව ප්‍රාදේශීය කළමනාකරුගේ නිර්දේශය සහිතව මාගේ අනුමැතිය සඳහා ප්‍රධාන කාර්යාලය විමසන්න.

(ඇ) උදුරා නොදමන ගස් වර්ග, එහි සංඛ්‍යාව සහ ආවරණය වන බිම් ප්‍රමාණය මූලික පරීක්ෂණ වාර්තාවේ පරීක්ෂණ නිලධාරී තැන විසින් පැහැදිලිව සඳහන් කළ යුතුය. උදුරා ඉවත් කිරීමට ඉල්ලුම්කරු එකඟ වන ගස් වර්ග ඇතිනම් ඒ පිළිබඳවද මූලික පරීක්ෂණ වාර්තාවේ සඳහන් කළ යුතුය.

(ඈ) මේ පරිදි වෙනත් ශාක සඳහා අඩු කිරීම් ගණනය කිරීමේදී අක්කරයකට පර්. 80ක් ඉක්මවා අඩුකළ යුතු අවස්ථා ඇති විට පමණක්, තේ මිශ්‍ර වගා යටතේ අවසරපත්‍රයක් ලබා ගැනීමට සුදුසුකම් නොලබයි.

3.0 මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳව මීට පෙර නිකුත් කරන ලද පහත සඳහන් චක්‍රලේඛ හා අභ්‍යන්තර ලිපි මේ අනුව අවලංගු කරන බව සලකන්න.

අ. වසා/ව.ආ/ප්‍රති 1986.01.23 දිනැති අංක 127 චක්‍රලේඛ ලිපිය.
ආ. වසා/ව.අ.ා/ප්‍රති 1987.06.26 දිනැති අංක 152 චක්‍රලේඛ ලිපිය
ඇ. වසා/ව.ආ/ප්‍රති 1987.10.12 දිනැති අභ්‍යන්තර උපදෙස් ලිපිය.

ඩී. ජේ. නානායක්කාර
සභාපති.

පිටපත්:- 1. ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
2. අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය
3. අධ්‍යක්ෂ, සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුව.
4. සාමාන්‍යාධිකාරී, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය.
5. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී.
6. අභ්‍යන්තර විගණක.
7. ලේකම්/ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී.
8. සියලුම තේ පරී/ව්‍යාපෘති නිලධාරීන්.